## කැලණිය අධ්‍යාපන කලාපය

අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2016 10 ශ්‍රේණිය

### පෙරදිග සංගීතය - I

නම : .................................................................................... කාලය : පැය 3

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1. නි ස ග ම ප ධ ප ම ග රි ස මෙම ස්වර අභ්‍යාසය අයත්වන්නේ,
   1. යමන් රාගයට 2. බිලාවල් රාගයට 3. කාෆි රාගයට 4. භෛරවි රාගයට

2. රාගධාරි සංගීතයේදී ස්වර "මාලිකා" නමින් හඳුන්වන්නේ
   1. සර්ගම් ගීත 2. ඛයාල් ගීත 3. ලක්ෂණ ගීත 4. මධ්‍ය ලය ගීත

3. "කලන මේලගත පිරුණු නිස ගැයෙන" මෙම ලක්ෂණ ගී පාදය ඇතුළත් රාගය වන්නේ,
   1. භූපාලි 2. භෛරවි 3. යමන් 4. බිලාවල්

4. ඉහත ප්‍රශ්නයේදී පිරුණු නිස ගැයෙන යනුවෙන් අදහස් කරන්නේ එම රාගය
   1. දිවා කාලයේදී ගායනා වන බවයි
   2. සම්පූර්ණ ජාතියට අයත්වන අතර දිවා කාලයේදී ගායනා වන බවයි.
   3. රාත්‍රී දෙවන ප්‍රහාරයේදී ගැයෙන බවයි.
   4. සම්පූර්ණ ජාතියට අයත්ව අතර රාත්‍රී කාලයේදී ගායනා වන බවයි.

5. සෑම රාගයකම මේලය එම රාගයේ නමින්ම යෙදී ඇත. එසේ නොවන රාගයකි.
   1. භෛරවි 2. යමන් 3. කාෆි 4. භූපාලි

6. ස්වර ලිපියක sing to sign සංකේතය හඳුන්වන්නේ,
   1. 𝄋 2. // 3. [ ] 4. ||: :||

7. ස්වර ලිපි දෙකක පිළිවෙලින් 6/8 හා 7/8 යනුවෙන් තාල සංකේත දෙකක් දක්වා ඇත්නම් එම ස්වර ලිපි දෙක පිළිවෙලින්
   1. දදරා හා දීප චන්දි තාලයන්ට අනුව වැයේ.
   2. බෙම්ටො හා ජප් තාලයන්ට අනුව වැයේ
   3. බෙම්ටො හා දදරා තාලයන්ට අනුව වැයේ
   4. බෙම්ටො හා දීප චන්දි තාලයන්ට අනුව වැයේ

8. /ගමප පප්‍ර / ÷ / ගමප පධප / මපම ගරි- / මෙම ස්වර පාදයේ දෙවන විභාගයේදී
   1. පළමු විභාගයේ ඇති ස්වර ඛණ්ඩයම වාදනය කරයි.
   2. කිසිවෙක් වාදනය නොකරයි.
   3. තුන්වන විභාගයේ ඇති ස්වර වාදනය කරයි.
   4. මුළු ස්වර පාදයට ලය දෙගුණ කොට වයන බවයි.

9. ස්වර පුවරු වාදනය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශයකි,
1. ස්වර ඥානය දියුණු වේ.
2. ස්වර සංවාද පිළිබඳ සෘජු අත්දැකීම් ලබයි.
3. වාදනය කරමින් ගැයීමේ හැකියාව වර්ධනය වේ.
4. අනෙකුත් සංගීත භාණ්ඩද වාදනය කිරීමට හැකියාව ලැබෙයි.

10. ග්‍රැමෆෝන් තැටි ගීතවල දක්නට ඇති ලක්ෂණයකි
1. ද්‍රවිඩ ගීතවල අනුකාරක ලක්ෂණයන් ඇත. 2. තනුවට ප්‍රධාන තැනක් දී ඇති බව
3. ආරම්භක හා අතුරුවාදන නොමැත. 4. ගීතය ඉතා කෙටිවීම

11. ග්‍රැමෆෝන් තැටිවලට නැගුණු මුල්ම සිංහල ගීත වූයේ,
1. සරල ගීත 2. නාඩගම් ගීත 3. නූර්ති ගීත 4. මධ්‍ය ලය ගීත

12. ග්‍රැමෆෝන් ගීත ගායනය කළ ගායක ගායිකා යුවළකි,
1. එච්.ආර්. ජෝතිපාල-රුක්මණී දේවි 2. නන්ද මාලනී -පණ්ඩිත් අමරදේව
3. එච්.ඩබ්. රූපසිංහ-රුක්මණී දේවි 4. මොහොමඩ් ගවුස්-ශ්‍රේටා ජෙනට් ද සිල්වා

13. "ඕලු පිපීලා විල ලෙලදෙනවා" යන ගීතයට අදාල සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. සුනිල් ශාන්ත මහතා විසින් ගයා ඇත.
2. ආනන්ද සමරකෝන් ශූරීන් විසින් පදමාලාව ලියා ඇත.
3. ගුවන් විදුලියේ තැටිගත කළ මුල්ම සරල ගීතය
4. ආනන්ද සමරකෝන් ශූරීන් විසින් ගයා ඇත.

14. රේඛාව චිත්‍රපටයේ ගීත
1. සුනිල් ශාන්ත මහතා විසින් ගයා ඇත.
2. ආනන්ද සමරකෝන් ශූරීන් විසින් පදමාලාව ලියා ඇත.
3. මොහොමඩ් ගවුස් මහතා විසින් තනු රචනා කර ඇත.
4. සුනිල් ශාන්ත මහතා විසින් ගීතනු රචනා කර ඇත.

15. ආනන්ද සමරකෝන් ශූරීන් විසින් නිර්මාණය කරන ලද ගීතවල
1. බටහිර සංගීතමය ලක්ෂණ දක්නට ඇත
2. බෙංගාලි ජන ගී නාදමාලා දක්නට ඇත.
3. හින්දි ගී වල අනුකාරක බව දක්නට ඇත.
4. රාගධාරී ලක්ෂණ දක්නට ඇත.

16. කපිරිඤ්ඤ ගීත ඇසුරින් නිර්මාණය කරගත් සිංහල ජන ගීයක් නොවන්නේ,
1. රස ආහර කවලා 2. මී වදයකි ජීවිතේ
3. නැලවෙන මව් උකුලේ 4. යමන් බණ්ඩො වෙසක් බලන්ඩ

17. කපිරිඤ්ඤ ගීත වැඩි වශයෙන් වැයෙන්නේ
1. දදරා තාලයටයි. 2.කෙහෙර්වා තාලයටයි. 3.ත්‍රි තාලයටයි. 4. බෙම්ටො තාලයටයි.

18. පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය වේ,
1. ගුත්තිල කාව්‍යයෙහි පැදි එකම විරිතකට අනුව රචනා කර ඇත.
2. සැළලිහිණි සංදේශයේ එන පැදිවල සරල ගැමි බස්වහර දක්නට ඇත.
3. සැළලිහිනි සංදේශය වෑත්තෑවේ හිමියන් විසින් රචනා කර ඇත.
4. සමුද්‍රඝෝෂ විරිතෙන් ගැයෙන පැදි බොහොමයක් සැළලිහිනි සංදේශයේ ඇතුළත් ය.

19. ගුත්තිල කාව්‍යයේ එන "රූ රසේ අදිනා ලෙසේ" නම් පැදියේ එක් ගී පාදයකට
1. මාත්‍රා 12 කි. 2. මාත්‍රා 16 කි. 3. මාත්‍රා 28 කි. 4. මාත්‍රා 14 කි.

20. සේ ගී වල
1. සරල ගැමි බස් වහරක් ඇත. 2. වියත් බස් වහරක් ඇත.
3. නිර්මාතෘවරයා අවිනිශ්චිතය 4. අනාසානාත්මක බව දක්නට ඇත.

21. පැල් ගී
1. මෙහෙ ගී වලට අයත් ය. 2. ඇදහිලි ගී වලට අයත් ය.
3. සේ ගී වලට අයත් ය. 4. සමාජයීය ගීත වලට අයත් ය.

22. විවිධ වෘත්තීන් ආශ්‍රිතව ගොඩ නැගී ඇති ජන ගී හඳුන්වන්නේ,
1. සේ ගී 2. ගැමි ගී 3. සමාජයීය ගී 4. මෙහෙ ගී

23. "මත් මත් කරවන දන මුළු දෙරණ" යනු සොළොස්මත් පැදියක එක් පාදයකි. එය ගායනා වන්නේ,
1. මැදුම් තනි තිතට 2. මහ තනි තිතට
3. සුළු මැදුම් දෙතිතට 4. මැදුම් මහ දෙතිතට

- 24 සිට 27 දක්වා ප්‍රශ්න සඳහා පහත දී ඇති වගන්ති උපයෝගී කොට ගන්න

A - මුඛ පරම්පරාවෙන් පැවත එන
B - වියත් බසින් රචනා වීම
C - උපමා, උපමේයන්, ශබ්ද අලංකාර, එළිවැට සහ අනුප්‍රාස රසය මතු කරමින් රචනා කිරීම
D- පද මාලා සරලවීම
E - නාද මාලා සරල වීම
F - අනාසානාත්මත බව

24. මෙහෙ ගී බොහොමයකට ආවේණික ලක්ෂණයක් වුවද මෙම ලක්ෂණය සමහර සේ ගී වලද දක්නට ඇත. එනම්,
1. A 2. B 3. D 4. F

25. සේ ගී වල දක්නට ඇති ලක්ෂණයක් වන්නේ,
1. A,B හා F 2. B,C හා E 3. A,C හා F 4. B සහ C

26. ප්‍රශස්ත ගීතවල දක්නට ඇති ලක්ෂණයකි.
1. A 2. B 3. D 4. F

27. පාරු ගී, ගැල් ගී, මෙම ගී වර්ග ත්‍රිත්වයටම පොදු වූ ලක්ෂණයකි.
1. A 2. D 3. E 4. F

28. සාම්ප්‍රදායික නාඩගම් තනුවල ඡායාව ඇති ගීත ඇතුළත් නාට්‍ය යුගලයකි.
1. මනමේ - රතු හැට්ටකාරි 2. සිංහබාහු - තාරාවෝ ඉගිලෙති
3. තාරාවෝ ඉගිලෙති - නරිබෑනා 4. සිංහබාහු - මනමේ

29. ඇදහිලි හා සාමාජයීය ගී ගනයට අයත් ගී විශේෂයන් දෙකකි.
1. තුන් සරණේ ගී /පාරු ගී
2. පතල් ගී / ශාන්තිකර්ම ගී
3. තුන් සරණේ ගී / කෙළි ගී
4. කෙළි/ හටන් ගී

30. තබ්ලාවේ කොටස් දෙක නම් කරන්නේ,
1. දයාව, බායාව
2. චාන්ටි, ලව
3. චාන්ටි, මෛදන්
4. ගට්ටා, ලව

31. දායාවේ චාන්ටි කොටසින් උපදවා ගත හැකි අක්ෂර ත්‍රිත්වයකි.
1. ගෙ,ති,ට
2. ති, ට, තුං
3. ධා, ධිං, ගෙ
4. යං, තිරිකිට, තු

32. ඉන්දියානු හා ශ්‍රී ලාංකීය දක්ෂ තබ්ලාවාදකයින් දෙපළකි,
1. පණ්ඩිත් රවිශංකර් - විජේරත්න රණතුංග
2. හරිප්‍රසාද් චෞරයියා - ඩී.ආර්. පීරිස්
3. ඔස්තාද් ශබීර් හුසේන් - ඩී.ආර්. පීරිස්
4. ජත් ජීත් සිං - විජේරත්න රණතුංග

33. තබ්ලාවේ හස්ත සාධන අභ්‍යාස වර්ගයකි
1. ජලා
2. අලංකාර
3. ගත්
4. කයදා

34. තබ්ලාවේ හඬ උස් පහත් කරගැනීමට අවශ්‍ය කොටසකි.
1. චාන්ටි
2. සට්ටා
3. ලවය
4. ස්‍යාහි

35. කපිරිඤ්ඤ සංගීතය පිළිබඳ පරීක්ෂණ රැසක් සිදුකළ ශ්‍රී ලාංකීය විද්වතෙකි.
1. සි. ද එස් කුලතිලක
2. ඩබ්.බී. මකුලොළුව
3. මහාචාර්ය සුනිල් ආරියරත්න
4. වින්සනට් සෝමපාල

36. කපිරිඤ්ඤ ගීත ගායනයේදී තාල වාදනය සඳහා යොදගන්නා ලදී.
1. තබ්ලාව
2. උඩැක්කිය
3. ඩොලැක්කිය
4. බොංගො

37. මුල් කාලයේදී ගුවන් විදුලියෙන් ප්‍රචාරය වූ සරල ගීතයකි.
1. වරෙන් හීං සැරේ
2. ඇසේ මතුවන කඳුලු බිඳුගෙන
3. සුනිල්වන් නුවන් යුග
4. සුවඳ පද්ම ඕලු ආදී

38. "දෑතට වළලු මල් මුතුලැල් මාල පොටයි" මෙම ජනප්‍රිය සරල ගීතයට වඩාත් සමීප දයකත්වයක් දක්වන සංගීතඥයා වන්නේ,
1. රෝහණ බැද්දගේ
2. සී.ද එස් කුලතිලක
3. ඩබ්.බී. මකුලොළුව
4. පණ්ඩිත් අමරදේව

39. අපගේ දේශීය නාට්‍ය මාලාවේ එන "දෙපානෝ" යනු
1. ග්‍රීක නාට්‍යයකි
2. මුද්‍රා නාටයකි
3. ඔපෙරාවකි
4. ටෙලි නාට්‍යයකි.

40. ඉහත නම් සඳහන් නාට්‍යයේ නිර්මාතෘ වන්නේ,
1. සී.ද එස් කුලතිලක
2. ඩබ්.බී. මකුලොළුව
3. රෝහණ බැද්දගේ
4. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

## පෙරදිග සංගීතය II

10 ශ්‍රේණිය

දෙවන වාර පරීක්ෂණය

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

1.) 1 සිට 10 දක්වා වූ ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1. නි රි ග ම ප ම ග රි ස මෙම ස්වර ඛණ්ඩය යමන් රාගයට උචිත වන අයුරින් සංකේතවත් කර ලියන්න
2. රාගයක ආරෝහණ, අවරෝහණ වාදී, සංවාදී ස්වර ආදිය පහසුවෙන් මතකයේ රඳවා ගැනීම පිණිස ඉවහල් වන ගීත විශේෂය හඳුන්වන නම කුමක්ද?
3. රාගයකක මධ්‍යලය, සර්ගම්, ලක්ෂණ වැනි ගීත ගායනයේදී ශ්‍රැතිය පවත්වාගෙන යාම පිණිස පසෙකින් වැයෙන තන්ත්‍රීය සංගීත භාණ්ඩය හඳුන්වන නම කුමක්ද?
4. යමන් රාගයේ වාදී සංවාදී ස්වර පිළිබඳ කියවෙන එහි ලක්ෂන ගීතයේ එම කොටසට අදල ගී පාදය ලියන්න.
5. සංගීත කෘතියක් සංරක්ෂනයට මෙන්ම එය වාදකයින් මගින් නැවත ප්‍රති නිර්මාණය කරවා ගැනීම සඳහා ඉවහල් වන්නේ කුමක්ද?
6. ගැමි ගීත යටතේ එන තුන් සරණේ ගීත අයත් වන්නේ කිනම් ගී විශේෂයකටද?
7. අනාසාතාත්මක ගැයෙන සේ ගීයක මුල් පදය ලියන්න.
8. කපිරිඤ්ඤ ගී වල ආභාෂයට අනුව නිර්මාණය කරන ලද සිංහල ගීතයක මුල්පද කිහිපය ලියන්න.
9. කෙහෙර්වා තාලයට ගැලපෙන බටහිර තාලය සංකේතවත් කර දක්වන්න.
10. දේශීය ජන ගායනාවන් පිළිබඳ පර්යේෂණ රැසක් සිදුකර ඒවා ඇතුළත් කොට ග්‍රන්ථයක්ද සම්පාදනය කරනු ලැබූ සංගීතඥයා කවුද?
11. ඉහත ප්‍රශ්ණයට අදළ ග්‍රන්ථයේ නම කුමක්ද?
12. කාලගෝල නාට්‍යයේ එන එක් ගීයක මුල් පද කිහිපය ලියන්න. (ල: 1x12=12)

2.) පහත් දී ඇති ස්වර ප්‍රස්ථාර පේලි දෙක උපයෝගී කොටගෙන අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A - / ස ධ ප ධ / ම ප ග ම / නි ධ - ස / - රි ග ම/

B - / ග රි නි රි / ස - නි රි ග ම / ප ම ග ප / රි ග රි ස/

1. A හා B ට අයත් රාග දෙක නම් කරන්න (ල: 2)
2. A හා B යන රාග දෙකෙන් එකක් තෝරාගෙන එහි සර්ගම්, මධ්‍යලය, හෝ ලක්ෂණ ගීතයක ස්ථායී කොටස පමණක් ගීත-ස්වර ප්‍රස්ථාර කරන්න. (ල: 6)
3. ඉහත ඔබ තෝරාගත් රාගයට අදලව පහත වගුව සම්පූර්ණ කරන්න.

| මේලය | ජාතිය | ආරෝහණ | අවරෝහණ | වාදී ස්වරය | සංවාදී ස්වරය | මුඛ්‍යාංගය | ගාන සමය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

(ල: 1/2 x 8=04)

3.) පහත සඳහන් කර ඇත්තේ මුල් යුගයේ ගුවන්විදුලි සරල ගී කිහිපයක මුල් පදයන් වේ.

- වරෙන් හීන් සැරේ
- ඕලු පිපීලා වෙල ලෙල දෙනවා
- එන්ඩද මැණිකේ
- දකුණ නැගෙනහිර
- බැස සීතල ගඟුලේ
- අක්කෙ අක්කෙ අර බලන්නකෝ
- ලංකා ලංකා
- සුනිල ගුවනෙ පායා

1. මෙම ගීත ලැයිස්තුව ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සුනිල් ශාන්ත මහතා ගැයූ ගීත | ආනන්ද සමරකෝන් මහතා ගැයූ ගීත |
|---|---|
| | |

(ල: 6)

2. මෙම දෙපළගෙන් එක් අයෙකු තෝරාගෙන එතුමා පිළිබඳව එතුමාගෙන් සිංහල සංගීත ක්ෂේත්‍රයට සිදුවූ සේවාවන් පිළිබඳව කරුණු 3ක් ලියා දක්වන්න (ල: 3)
3. මෙම සංගීතඥයන් දෙපළට අමතරව මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී නිර්මාණයට දයක වූ වෙනත් ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න. (ල: 3)

4.) 1. පහත ඇති වගුව සම්පූර්ණ කරන්න.

| ස්වර පාදය | Time signature | හින්දුස්ථානි තාලය |
|---|---|---|
| /ග-ම/ප-ග/ම-ග/රි--/ | $3_4$ | දාදරා |
| /ස-/ප-ප/ප-/පධප/ | | |
| /ස-ගම/පධනිප/ධ-ප-/----/ | | |
| /ගමප පප-/ගමප පප-/ගමප ධපම/රිගරි ස--/ | | |
| /ස-ස/ග-ස-/ප-ධ/පධමප/ | | |

(ල: 1/2 x 8=04)

2. පහත දී ඇත්තේ ස්වර ප්‍රස්ථාරවල දැකිය හැකි සංකේත තුනකි.ඉන් දෙකක් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

i. $ ii. [ ] iii. /. (ල: 2 x 4=08)

5.) ජන ගී පාඩම ඇසුරෙන් පහත ඇති ඡේදයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. ජන ගී ...................... හා ........................ වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙද දැක්විය- හැකිය. ඉන් වියත් බස් වහරක් ............................ තුළද, සරල ගැමි බස් වහරක් .......................... තුළද දැකිය හැකිය. තවද කිසියම් වූ ජීවන වෘත්තියක යෙදෙන විට ගැයූ ගීත .......................... ලෙසද, ගැමි ඇදහිලි හා විශ්වාස මත පදනම් වූ ගීත ................................ ගී වශයෙන්ද හැඳින්විය. ........................ හා ................................ වැනි ගී සමාජයීය ගී ගනයට අයත් විය. සැළලිහිණි සංදේශයේ "පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට" නැමති කාව්‍ය ................................. ගැයෙන අතර එය ..................................... විරිතට අනුව රචනා වී තිබේ. (ල: 1/2 x 10=05)

2. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා
රන් රසේ එක්වන ලෙසේ වෙන නාද නූපා තබ තබා
මෙම ගී පද දෙක එය ගැයෙන තිතට අනුව පද ප්‍රස්ථාර කර දක්වන්න. (ල: 05)

3. මෙම ගීතය ගායනා කිරීමේදී එහි එක් පාදයක් සඳහා මාත්‍රා කීයක් ලැබේද? ඒ අනුව එම පැදිය හඳුන්වන්නේ කෙසේද? (ල: 02)

6.) 1. කපිරිඤ්ඤ සංගීතය පිළිබඳ පහත ඇති කරුණුවලට අදාළව තොරතුරු දෙක බැගින් ලියන්න.

i. කපිරිඤ්ඤ සංගීතයේ මෙරට ව්‍යාප්තිය

ii. එහි සංගීතමය ලක්ෂණ

iii. කපිරිඤ්ඤ ගීත ඇසුරින් නිර්මාණය වූ සිංහල සරල ගී
(සරල ගී දෙකක මුල් පද පේළි ලිවීම ප්‍රමාණවත් වේ. (ල: 2 x 3=06)

2. කපිරිඤ්ඤ ගීතයක් හෝ ඒ අසුරින් නිර්මාණය වූ සිංහල සරල ගීතයක මුල් කොටස පද ප්‍රස්ථාර කර දක්වන්න. (ල: 06)

7.) 1. ශ්‍රී ලංකාව තුළ ග්‍රැමෆෝන් තැටි ගීත කලාවේ ආරම්භය පිළිබඳව ගෙනහැර දැක්විය හැකි වැදගත් කරුණු දෙකක් සඳහන් කරන්න. (ල: 02)

2. ග්‍රැමෆෝන් තැටි ගීත යුග අනුව කොටස් 3කට බෙද දැක්විය හැකිය. එම යුග තුනද එම එක් යුගයක් සඳහා නිදසුන් 2 බැගින්ද ලියා දක්වන්න. (ල: 06)

3. ක්‍රි.ව 1937 දී ග්‍රැමෆෝන් තැටි ගී යුගයේ වෙනස් මගක් ගත්හ. මෙය සනාථ කිරීම සඳහා කරුණු 04ක් ලියන්න. (ල: 04)